# මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
# 2025.06.13 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
- ගරු මන්ත්‍රී ජී.ජී පාලිත කුමාර මහතා
- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා
- ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා
- ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා
- ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා
- ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා
- ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ත්‍ර රංගනාත් මහතා
- ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා
- ගරු මන්ත්‍රී හෂිත සුබෝදන මාරතුඩුවගේ මහතා
- ගරු මන්ත්‍රී පී.ජී.බසින්ද්‍යා පුෂ්පමාලි මෙය
- ගරු මන්ත්‍රී සමල්ෂා උෂාදි විජේවික්‍රම මෙය
- ගරු මන්ත්‍රී දිල්කා හන්සිකා අබේසුන්දර මෙය
- ගරු මන්ත්‍රී ජේ.එල්.සුමිත් මහතා
- ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා

නොපැමිණි:- - ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ හත්වන සභා වාරයේ 01 වන මාසික සභා රැස්වීම 2025 ජුනි මස 13 වන දින ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 09.30 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ කරන ලදී.

**01. පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.- නැත**

**02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන**

සියලු දෙනා ඉතාම ගෞරවයෙන් පිළිගන්නවා.කිසිම පක්ෂ භේදයක් නෑ.සියලු දෙනාගේ බලාපොරොත්තුව ඉතා හොඳ ප්‍රාදේශීය සභාවක් නිර්මාණය කිරීම.එමනිසා සියලු දෙනා සහයෝගයෙන් වැඩ කරමු.2026 වර්ෂය සඳහා අයවැය යෝජනා 2025.07.31 වන දිනට පෙර ලබා දෙන්න කියලා සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.
ඒ වගේම තමයි වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දෙන්න.මන්ත්‍රීවරයෙක් ලෙස දිවුරුම් දීමෙන් පසු අනිවාර්යයෙන් වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදිය යුතුයි.නැතිනම් දේපළ රාජසන්තක කිරීම හෝ මන්ත්‍රී ධූරය අහෝසි කිරීමට හැකියි.

**03.සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.**

හර්ෂණී ගුණසේකර මන්ත්‍රීතුමිය අසනීප හේතුවෙන් ලිපියක් මඟින් නිවාඩු ඉල්ලා සිටිනවා.එතුමියට නිවාඩු අනුමත කරනවා.

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.**

**05.යථා පරිදි කල්දී ඇති යෝජනා**

**යෝජනා අංක 5:1**

1988 ප්‍රාදේශිය සභා රීති (රැස්වීම් වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පරිපාටිය) 2(1) අනුව මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ මාසික සභාව සෑම මසකම දෙවන සතියේ අඟහරුවාදා දින පෙ.ව.9.30 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී පැවැත්වීමටත්, එදින රජයේ නිවාඩු දිනයක් වන්නේ නම්, පසුව එළැඹෙන වැඩකරන පළමු දිනය ඒ සඳහා යොදා ගැනීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව 1988 ප්‍රාදේශිය සභා රීති (රැස්වීම් වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පරිපාටිය) 2(1) අනුව මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ මාසික සභාව සෑම මසකම දෙවන සතියේ අඟහරුවාදා දින පෙ.ව.9.30 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී පැවැත්වීමටත්, එදින රජයේ නිවාඩු දිනයක් වන්නේ නම්, පසුව එළැඹෙන වැඩකරන පළමු දිනය ඒ සඳහා යොදා ගැනීමේ යෝජනාවට කිසිවෙකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 5:2**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව,2025 වර්ෂය සඳහා මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ බලතල, කාර්යයන් පහසු කර ගැනීම සඳහා පහත එක් එක් විෂය සම්බන්ධයෙන් සභාවේ සභිකයන්ගෙන් සමන්විත කාරක සභා පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

1 **මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටුව -**

- ගරු සභාපති - රණවීර කංකානම්ගේ නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උප සභාපති - කෝදගොඩ ගමගේ සමන්කුමාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - අතපත්තු හේවා පෙරමුණගේ චරිත් උදාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී -දික්ඕවිටකංකානම්ගේ පියදාස විජයරත්න මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - සමල්ෂා උෂානි විජේවික්‍රම මෙය
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - හෂිත සුබෝදන මාරතුඩුවගේ මහතා

2 **නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කමිටුව -**

- ගරු සභාපති - රණවීර කංකානම්ගේ නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උප සභාපති - කෝදගොඩ ගමගේ සමන් කුමාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - රූබසිං ජයවර්ධන ලයනල් මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඌරුමුත්ත ගමගේ දිමේන්ත්‍ර රංගනාත් මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - දිල්කා හන්සිකා අබේසුන්දර මෙය
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - නිහාල් අබේවික්‍රමසිංහ මහතා

3 **කාර්මික සේවා කමිටුව -**

- ගරු සභාපති - රණවීර කංකානම්ගේ නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උප සභාපති - කෝදගොඩ ගමගේ සමන් කුමාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඌරුමුත්ත ගමගේ දිමේන්ත්‍ර රංගනාත් මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - අතපත්තු හේවා පෙරමුණගේ චරිත් උදාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - රූබසිං ජයවර්ධන ලයනල් මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - පන්නිගල ගමගේ බසින්දා පුෂ්පමාලි මෙය
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - පහට්ටුගේ පාලිත කුමාර මහතා

4 **පරිසර සහ පහසුකම් කමිටුව -**

- ගරු සභාපති - රණවීර කංකානම්ගේ නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උප සභාපති - කෝදගොඩ ගමගේ සමන් කුමාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - නිශාන්ත නන්ද කුමාර මුණසිංහ මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - තෙල්ල මුරේගේ ජගත් චමින්ද කුමාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - දික්ඔවිට කංකානම්ගේ පියදාස විජයරත්න මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - රංවිගොඩ ගමගේ හර්ෂණී ගුණසේකර මිය
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ජයවර්ධන ලියනගේ සුමිත් මහතා

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා

**ගරු මන්ත්‍රී පී.ජී. පාලිත කුමාර මහතා**

සියලුම දෙනාගෙන් අවසරයි.ගරු සභාපතිතුමනි,මුදල් කමිටුව සඳහා පළපුරුදු සහිත තවත් මන්ත්‍රීවරු දෙදෙනෙක් ඇතුලත් කරන ලෙස යෝජනා කරනවා.කමිටුවේ සාමාජිකයින් සංඛ්‍යාව වැඩි කිරීමට නොහැකිනම් දැනට ඇතුලත් කර ඇති නම් දෙකක් ඉවත් කර අලුත් නම් ඇතුලත් කරන්න මන්ත්‍රීවරු දෙදෙනෙක් කැමැත්ත ප්‍රකාශ කරල තියනවා.

**ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා**

ගරු මන්ත්‍රීතුමනි,කමිටු සාමාජික සංඛ්‍යාව වැඩි කිරීමට හෝ වෙනස් කිරීමට බලාපොරොත්තු වෙන්නෙ නැහැ.මොකද අලුත් අයටත් අවස්ථාව ලබා දෙන්න අවශ්‍ය නිසා හොඳින් සිතා බලා තමයි මේ කමිටු පත් කළේ ඒ නිසා කමිටුවේ වෙනසක් වෙන්නෙ නෑ.

**ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා විසින් ඉදිරිපත් කළ සංශෝධන යෝජනාව**

2025.06.13 දිනැති මාසික සභා රැස්වීමේ න්‍යාය පත්‍රයේ 5(2) යෝජනාවේ පරිසර හා පහසුකම් කමිටුවේ සඳහන් නම් වලට අමතරව ගරු මන්ත්‍රී ගමාච්චි පතිරණ උදය සාන්ත මහතා,ගරු මන්ත්‍රී රුබසිං ජයවර්ධන ලයනල් මහතා යන මන්ත්‍රීවරුන්ගේ නම් ඇතුලත් කරමින් සංශෝධිත යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

1 **මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටුව -**

- ගරු සභාපති - රණවීර කංකානම්ගේ නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උප සභාපති - කෝදගොඩ ගමගේ සමන්කුමාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - අතපත්තු හේවා පෙරමුණගේ චරිත් උදාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - දික්ඔවිට කංකානම්ගේ පියදාස විජයරත්න මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - සමල්ෂා උෂානි විජේවික්‍රම මෙය
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - හෂිත සුබෝදන මාරතුඩුවගේ මහතා

2 **නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කමිටුව -**

- ගරු සභාපති - රණවීර කංකානම්ගේ නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උප සභාපති - කෝදගොඩ ගමගේ සමන් කුමාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - රුබසිං ජයවර්ධන ලයනල් මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඌරුමුත්ත ගමගේ දිමේන්ත්‍ර රංගනාත් මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - දිල්කා හන්සිකා අබේසුන්දර මෙය

- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - නිහාල් අබේවික්‍රමසිංහ මහතා

3 **කාර්මික සේවා කමිටුව -**

- ගරු සභාපති - රණවීර කංකානම්ගේ නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උප සභාපති - කෝදගොඩ ගමගේ සමන් කුමාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඌරුමුත්ත ගමගේ දිමේන්ත්‍ර රංගනාත් මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - අතපත්තු හේවා පෙරමුණගේ චරිත් උදාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - රුබසිං ජයවර්ධන ලයනල් මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - පන්නිගල ගමගේ බසින්දයා පුෂ්පමාලි මෙය
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - පහට්ටුගේ පාලිත කුමාර මහතා
-

4 **පරිසර සහ පහසුකම් කමිටුව -**

- ගරු සභාපති - රණවීර කංකානම්ගේ නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උප සභාපති - කෝදගොඩ ගමගේ සමන් කුමාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - නිශාන්ත නන්ද කුමාර මුණසිංහ මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - තෙල්ල මුරේගේ ජගත් චමින්ද කුමාර මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - දික්ඕවිට කංකානම්ගේ පියදාස විජයරත්න මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - රංචිගොඩ ගමගේ හර්ෂණී ගුණසේකර මිය
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ජයවර්ධන ලියනගේ සුමිත් මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ගමාච්චි පතිරණ උදය සාන්ත මහතා
- ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - රුබසිං ජයවර්ධන ලයනල් මහතා

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව,2025 වර්ෂය සඳහා මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ බලතල, කාර්යයන් පහසු කර ගැනීම සඳහා ඉහත එක් එක් විෂය සම්බන්ධයෙන් සභාවේ සභිකයන්ගෙන් සමන්විත කාරක සභා පත් කිරීමේ යෝජනාවට කිසිවෙකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන්ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:3</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව සඳහා මුදල් කමිටුවම පිළිගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව සඳහා මුදල් කමිටුවම පිළිගැනීමේ යෝජනාවට කිසිවෙකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:4</u>**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/ආ/05/6/පොදු හා 2009/04/23 දිනැති ලිපිය පරිදි ගරු සභාපතිතුමාගේ ජංගම දුරකථනය සඳහා මාසිකව රු2000 .ක දීමනාවක් ගෙවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා

ඒ අනුව පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/ආ/05/6/පොදු හා 2009/04/23 දිනැති ලිපිය පරිදි ගරු සභාපතිතුමාගේ ජංගම දුරකථනය සඳහා මාසිකව රු2000 .ක දීමනාවක් ගෙවීමේ යෝජනාවට කිසිවෙකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:5</u>**

දකුණු පළාත් සභා අමාත්‍ය මණ්ඩල තීරණ අංක 508: 8හා 2009 අගෝස්තු 11 වන දිනැති ලිපිය අනුව අනුව ගරු උප සභාපතිතුමාගේ ජංගම දුරකථනය සඳහා මාසිකව රු1500.ක දීමනාවක් ගෙවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා

ඒ අනුව දකුණු පළාත් සභා අමාත්‍ය මණ්ඩල තීරණ අංක 508: 8හා 2009 අගෝස්තු 11 වන දිනැති ලිපිය අනුව අනුව ගරු උප සභාපතිතුමාගේ ජංගම දුරකථනය සඳහා මාසිකව රු1500.ක දීමනාවක් ගෙවීමේ යෝජනාවට කිසිවෙකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:6</u>**

දකුණු පළාත් සභා අමාත්‍ය මණ්ඩල තීරණ අංක472 : 3හා 2008 අගෝස්තු 05 දිනැති ලිපිය පරිදි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ දුරකථන සඳහා මාසිකව රු 1000ක දීමනාවක් ගෙවීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

ඒ අනුව දකුණු පළාත් සභා අමාත්‍ය මණ්ඩල තීරණ අංක 472: 3 හා 2008 අගෝස්තු 05 දිනැති ලිපිය පරිදි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ දුරකථන සඳහා මාසිකව රු 1000ක දීමනාවක් ගෙවීමේ යෝජනාවට කිසිවෙකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:7</u>**

22/04/2013 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ගරු සභාපතිතුමා ,ගරු උප සභාපතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා මාසිකව රු.3000 ක උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනාවක් ගෙවීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා

ඒ අනුව 22/04/2013 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ගරු සභාපතිතුමා ,ගරු උප සභාපතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා මාසිකව රු.3000 ක උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනාවක් ගෙවීමේ යෝජනාවට කිසිවෙකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 5:8**

ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ දපස/ප්‍රඅමා/ආ 7/1/1හා 2014/10/21 දිනැති ලිපිය පරිදි ,ගරු සභාපතිතුමාගේ නිල වාහනය වන PF 7353 කැබ් රථය සඳහා මාසික ඉන්ධන සීමාව ලෙස මාසිකව ලීටර් 600 ක් ලබාදීම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා

ඒ අනුව ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ දපස/ප්‍රඅමා/ආ 7/1/1හා 2014/10/21 දිනැති ලිපිය පරිදි ,ගරු සභාපතිතුමාගේ නිල වාහනය වන PF 7353 කැබ් රථය සඳහා මාසික ඉන්ධන සීමාව ලෙස මාසිකව ලීටර් 600 ක් ලබාදීමේ යෝජනාවට කිසිවෙකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 5:9**

ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ දපස/ප්‍රඅමා/ආ 7/1/1හා 2014/10/21 දිනැති ලිපිය පරිදි ,ගරු සභාපතිතුමාගේ නිල කාර්යයන් සඳහා වෙන් කරන ලද වාහනය වන PF-7353 කැබ් රථය සඳහා මාසිකව රු300 ක මුදලක් සභා අරමුදලට ගෙවීම් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ පෞද්ගලික කාර්යයන් සඳහා යොදා ගැනීමට සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා

ඒ අනුව ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ දපස/ප්‍රඅමා/ආ 7/1/1හා 2014/10/21 දිනැති ලිපිය පරිදි ,ගරු සභාපතිතුමාගේ නිල කාර්යයන් සඳහා වෙන් කරන ලද වාහනය වන PF- 7353 කැබ් රථය සඳහා මාසිකව රු.300.00ක මුදලක් සභා අරමුදලට ගෙවීම් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ පෞද්ගලික කාර්යයන් සඳහා යොදා ගෙවීමේ යෝජනාවට කිසිවෙකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 5:10**

දකුණු පළාතේ නගර සභා සහ ප්‍රාදේශීය සභාවල ගරු සභාපතිවරුන්ගේ මහජන සම්බන්ධතා නිලධාරීන් පත්කිරීම සම්බන්ධ ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/SP/4/7/10/06 හා 2021.02.18 දිනැති ලිපිය සහ පළාත් පාලන කොමසාරිස්ගේ අංක 4 04/10/හා 2021.04.05 දිනැති ලිපිය ප්‍රකාරව ගරු සභාපතිවරයාට සහය වීම සඳහා සුදුසුකම්ලත් පුද්ගලයෙකු මහජන සම්බන්ධතා නිලධාරී ලෙස තෝරා පත් කර ගැනීමටත් දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSS/07/01/02 හා 2021.03.30 දිනැති ලිපිය ප්‍රකාරව මාසිකව රු 14500.00.ක වැටුපක් ගෙවීමටත් සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා

ඒ අනුව දකුණු පළාතේ නගර සභා සහ ප්‍රාදේශීය සභාවල ගරු සභාපතිවරුන්ගේ මහජන සම්බන්ධතා නිලධාරීන් පත්කිරීම සම්බන්ධ ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/SP/4/7/10/06 හා 2021.02.18 දිනැති ලිපිය සහ පළාත් පාලන කොමසාරිස්ගේ අංක 4 04/10/හා 2021.04 .05 දිනැති ලිපිය ප්‍රකාරව ගරු සභාපතිවරයාට සහය වීම සඳහා

සුදුසුකම්ලත් පුද්ගලයෙකු මහජන සම්බන්ධතා නිලධාරී ලෙස තෝරා පත් කර ගැනීමටත් දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSS/07/01/02 හා 2021.03.30 දිනැති ලිපිය ප්‍රකාරව මාසිකව රු 14500.00.ක වැටුපක් ගෙවීමේ යෝජනාවට කිසිවෙකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:11</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ චෙක්පත් අත්සන් කිරීම සඳහා පළමු අත්සන්කරු ලෙස ලේකම් එච්.එච්.අසංකා කුමාරි මහත්මිය හා දෙවන අත්සන්කරු ලෙස කළමනාකරණ සේවා නිලධාරී ජී.එච්.පූර්ණිමා ප්‍රියදර්ශනී මෙනවිය සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ චෙක්පත් අත්සන් කිරීම සඳහා පළමු අත්සන්කරු ලෙස ලේකම් එච්.එච්.අසංකා කුමාරි මහත්මිය හා දෙවන අත්සන්කරු ලෙස කළමනාකරණ සේවා නිලධාරී ජී.එච්.පූර්ණිමා ප්‍රියදර්ශනී මෙනවිය සුදුසු බවට කළ යෝජනාවට කිසිවෙකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**6. යථා පරිදි කල් දී නොමැති යෝජනා.**

**<u>යෝජනා අංක 6:1</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති නිලන්ත ධම්මජිත් මැතිතුමාගේ නිල වාහනය වන PF-7353 කැබ් රථය සඳහා නව රියදුරෙකු ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා .

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී. පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී. පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා

ඉහත 6:1 යෝජනාව සඳහා බෙදීමක් යෝජනා කරන ලදී.

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී. පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා

ඒ අනුව පහත නම් සඳහන් ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා
ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා
ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා
ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ත්‍ර රංගනාත් මහතා
ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා

පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හා තුමියන්ලා යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටින ලදී.

ගරු මන්ත්‍රී හෂිත සුබෝදන මාරතුඩුවගේ මහතා
ගරු මන්ත්‍රී පී.ජී.බසින්දාා පුෂ්පමාලි මෙය
ගරු මන්ත්‍රී සමල්ෂා උෂාදි විජේවික්‍රම මෙය
ගරු මන්ත්‍රී දිල්කා හන්සිකා අබේසුන්දර මෙය
ගරු මන්ත්‍රී ජේ.එල්.සුමිත් මහතා
ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව සඳහා පක්ෂව ඡන්ද 09ක්ද විපක්ෂව ඡන්ද 02ක්ද ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටි ඡන්ද ගනන 06ක්ද විය.ඒ අනුව වැඩි ඡන්ද 7කින් එම යෝජනාව සභා සම්මත විය.

**7) කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම. - නැත**

**8) ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම- නැත**

.

**9) වෙනත් කරුණු**

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**
ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.මුලින්ම මාලිම්බඩ බල ප්‍රදේශයේ ජනතා අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන්න බලාපොරොත්තු වන ඔබ සියලු දෙනාට මගේ සුභ පැතුම් එක් කරනවා විශේෂයෙන්ම කියන්න ඕන ජනතා අභිලාෂයන් ඉටු කිරීම වෙනුවෙන් යුක්ති සහගත ඕනෑම කාර්යක් සඳහා අපේ සහයෝගය ලබා දෙනවා කියන කාරණාව මතක් කරනවා.පසුගිය කාලයේ මහජන නියෝජිතයන් නොමැති කාලය තුළ ගරු ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය මාලිම්බඩ ජනතාව වෙනුවෙන් ඉටු කළා වූ සේවය වෙනුවෙනුත් ස්තූතිවන්තවනවා.ගරු සභාපතිතුමිනි,ඊයෙ දිනයදී අපේ නෙත ගැටුන පුවතක් පිළිබඳ අවධානය යොමු කරන්න කැමතියි.තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලයේ ඇට්ටෝනියා ගසක් පිළිබඳව.මේ ගසෙන් තිබෙන විශාල හානිය තමයි අකුරුගොඩ තෙලිජ්ජවිල ප්‍රධාන මාර්ගයේ තිබෙන්නේ.ගසට අඩි 20ක් පමණ ඉදිරියෙන් තිබෙනවා පෙර පාසල.ගස අඩි 100ක් පමණ විශාල ගසක්.ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරලා ගස ඉවත් කරන්න කියන ඉල්ලීම සිදු කරනවා.

ඒ වගේම තමයි මම ප්‍රාදේශීය සභාවට එන්න කලින් ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාවක් හැදුවා මැටි වලින්.ඊට පස්සෙ ලංකාවට නිදහස ලැබීමේ රජත ජයන්තිය වෙනුවෙන් ලක්ෂ 30ක පමණ මුදලක් ලැබුණා ඒකෙන් ප්‍රජා ශාලාව හැදුවා.ඊට පස්සෙ ප්‍රජා ශාලාව කඩලා තට්ටු දෙකට හදන්න කටයුතු කළා සභාවේ සල්ලියි පළාත් පාලන දෙපාර්තමේන්තුවෙ සල්ලියි යොදවලා.යට මහල හදන්න ලක්ෂ 12ක් සභාවෙන් ලැබුනා.කපරාරු කරන්න ලක්ෂ 2යි ලැබුනෙ.ඊටපස්සෙ මට සිදු වුනා රාජ්‍ය සේවකයෙකුට ලැබෙන ණය මුදලක් ලබාගෙන ප්‍රජා ශාලාවේ යට කොටසේ වැඩ අවසන් කරන්න.ඒ වගේම මං ස්තූතිවන්තවනවා ලේකම්තුමිය පළාත් පාලන දෙපාර්තමේන්තුවට ගිහින් සල්ලි ගෙනැල්ලා ලක්ෂ 60ක් 70ක් පමණ වියදම් කරලා ප්‍රජා ශාලාවේ වැඩ අවසන් කරලා තියනවා.සභාපතිතුමනි මෙහි උඩු මහල රාජ්‍ය නිලධාරින් වෙනුවෙන් දෙන්න තමයි අදහස් කළේ.ඒ නිසා පහල මහල ප්‍රදේශයේ පොදු රැස්වීම් පවත්වා ගෙන යාමටත් ඉහල මාලය රාජ්‍ය නිලධාරින් සුදුසු ආකාරයකට ස්ථාපිත කිරීමටත් කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

පසුගිය දිනක මාලිම්බඩ සම්බන්ධීකරණ කමිටුවේදී සභාපති ලෙස කටයුතු කරන මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එල්.එම්.අබේවික්‍රම මැතිතුමාගේ අවධානය අපි ඒ පිළිබඳව යොමු කලා.තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලයේ කාලයක් තිස්සෙ පස් කන්දක් කඩා ගෙන වැටිලා තියනවා.ප්‍රාදේශීය ලේකම්තුමියත් මමත් සම්බන්ධීකරණ කමිටුවට සම්බන්ධ වුණා එහිදී ඉක්මනින් පස් කන්ද අයින් කරලා යථා තත්වයට පත් කරන්න එතුමා පොරොන්දු වුණා.එමෙන්ම ඔය කියන ගස සම්බන්ධව මැදිහත්වන්න නීතිමය බාධාවක් අපිට තියන නිසා ප්‍රාදේශිය ලේකම්තුමිය දැනුවත් කරලා අවශ්‍ය කටයුතු ඉක්මණින් සිදු කරන්නම්.

ඒ වගේම තමයි ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාව සම්බන්ධව අපි ඉල්ලීමක් කලා ලිපියක් ඉදිරිපත් කරලා වගකීම භාරගෙන යතුරු භාරගන්න කියලා රාජකාරී කටයුතු කරගෙන යන්න.ඉදිරියේදී සභාව මැදිහත් වෙලා ඒ කටයුතු සිදුකරනවා.

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**

සියලු දෙනාගෙන් නැවතත් අවසරයි.සභාපතිතුමනි,ඔබතුමා තමයි මාලිම්බඩ නියෝජනය කරමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කරන්නේ.ගරු සභාපතිතුමනි,මාලිම්බඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයක් නෑ.ඒ තුළ දොස්තර සුගිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් වෙන් කරන ලද අකුරුගොඩ මධ්‍යම බෙහෙත් ශාලාවේ පර් 60ක පමණ භූමියක් තවත් පර් 10ක් සේවා පියසක් සඳහාත් වෙන් කරගෙන කටයුතු කළා.එහි ඉදිකිරීම් කරන්න 2025 ලෝක සෞඛ්‍ය සංවිධානය මුදල් ලබා දෙන්න සූදානමින් හිටියා.එතනින් එහාට ඒ ගැන සම්බන්ධතාවයක් නෑ.අපේ සෞඛ්‍ය මධ්‍යස්ථානය තියනවා පැරණි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙ එහි පිටුපස බැම්ම සඳහා අතිවිශාල මුදල් ප්‍රමාණයක් යනවා.ඒ වගේම පතල් හා කැනීම් කාර්යාලශය මඟින් නාය යාමට ලක්වන භූමියක් ලෙස හඳුනාගෙන තිබුණා වර්තමාන තත්වය පිළිබඳ දැනුවත් නෑ.ඒ නිසා මේ පිළිබඳ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යොමු කරලා මේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හදලා දෙන්න කියන ඉල්ලීම කරමින් නිහඬවනවා ස්තූතියි.

**<u>ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා</u>**

සභාවෙන් අවසරයි.ගරු සභාපතිතුමනි,පසුගිය දවස්වල ප්‍රදේශවාසින් ඉල්ලීම මත පහට්ටු කඩේ කියන සභාවට අයිති පුස්තකාල ඉඩම ඇත්තටම අපි ගිහින් සාකච්ඡා කරාම සෞඛ්‍ය වෛද්‍යතුමිය හා කාර්ය මණ්ඩලය කිව්වේ රථ ගාල් කරන්න ප්‍රමාණවත් පහසුකම් මදි කියලා.ඇත්තටම පාලිත මන්ත්‍රීතුමනි එයාලගේ අවශ්‍යතාවය තියෙන්නෙ සැලසුමක් අනුව සකස් කරලා සායනික කටයුතු හොඳින් සිදුකරගෙන යන්න.එයාලගේ තවත් අදහසක් තියනවා ඇහලුම් කම්හල ආසන්නයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඉඩමක් තියනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,පොලීසිය,සභාව ආසන්නයේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ආවොත් ජනතාවට පහසුවක් තියනවා.ඒත් එක්කම එයාලා පොඩ්ඩක් අකමැති

වෙන්නෙ පොඩි දරුවන්ට බෙහෙත් විද්දම වලිප්පුව වගේ රෝගයක් හැදුනොත් ඉක්මනින් රෝහලට ගෙනියන්න අවශ්‍යයි.හන්දියෙන් ඇතුලට යන්න මැලිකමක් දක්වන්නේ ඒ හේතුව නිසා.බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා**

ගරු සභාපතිතුමනි,උපසභාපතිතුමාට බෙහෙවින් ස්තූතිවන්ත වනවා.එහෙම නම් මේක තියෙන්නෙ ඔබතුමාල යටතේම තියන සමූපකාරෙට.පොලීසිය,ගාර්මන්ට් එක ඔය කියන භූමිය අයිති සමූපකාරයට.ඔය කියන කවුරුත් බදු ගෙව්වේ සමූපකාර දෙපාර්තමේන්තුවට.ගාර්මන්ට් එක වහලා තියෙන්නෙ.ඔබතුමාලා කතා කරලා ඒක හරි අරන් දෙන්න.පැරණි පුස්තකාලය තියන ඉඩම මදි අපි අවස්ථා කීපයකදි බැලුවා.එහෙම නැත්තන් මාතර අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ ගම්සභා හන්දියේ පර් 68ක් තියනවා.ගම් සභාව ඉස්සර තිබුණු භූමිය.අපිට ඕන මාලිම්බඩ කොහේ හරි මාලිම්බඩ මිනිස්සු වෙනුවෙන් මේක හදන්න.

**ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා**

ඉදිරිපත් වූ කරුණු සම්බන්ධව අවධානය යොමු වෙලා තියෙන්නෙ.අකුරුගොඩ ස්ථානයට යන්න සෞඛ්‍ය අංශ මැලිකමක් දක්වන්න හේතුව තමයි සායන වලට එන ගර්භණී මව්වරුන්,දරුවන්ට සිදුවන අපහසුතාවය.මාර්ග පහසුකම් තියන ස්ථානයක තිබීම පහසුවක් ඒකේ සාධාරණ පැත්තකුත් තියනවා.අපි උත්සාහ කරනවා ඉක්මනින් සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන්න ඒ සඳහා මුදල් වෙන් කරගන්නත් දිස්ත්‍රික්කෙ පැත්තෙන් කටයුතු කරමින් ඉන්නවා.

**ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.මම තෙලිජ්ජවිල කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරයා විදියට පළමුව ස්තූතිවන්ත වෙනවා ප්‍රදේශයේ ජනතාවට අසහාය ජනවරමකින් මාව තෝරා පත්කර ගත්තාට.මගෙන් නියෝජනය වන්නේ තනි පුද්ගලයෙක් නෙවෙයි.ප්‍රදේශයේ ජනතාව සුවහසක් බලාපොරොත්තු තියාගෙන තමයි මාව මෙතන තියලා තියෙන්නේ.ඒ මිනිස්සුන්ගේ බලාපොරොත්තු වලට හානියක් නොකර එය මගේ වගකීමක් ලෙස ගෙන මේ කාලය තුළ කටයුතු කිරීම තමයි මගේ බලාපොරොත්තුව.පළමුව ගරු සභාපතිතුමාට සුභාශිංෂණ එකතු කරනවා එතුමා බොහෝ දීර්ඝ කාලයක් මේ සභික පුටුවක තනි පාර්ශවයක් විදියට තනියම සටන් කරලා අද සභාපති විදියට පත් වෙලා ඉන්නවා.එතුමා දේශපාලන තලයේ ඉහළම මට්ටමේ ඍජුව ගණුදෙනු කරන පුද්ගලයෙක් විදියට සභාපති ලෙස පත්වීම මාලිම්බඩට සම්පතක්.තෙලිජ්ජවිල ගැන කියද්දි වෙන වෙනම යෝජනා ඉදිරිපත් කරන්න සූදානම් නෑ.අවස්ථා කිහිපයකදී කතා කළා තෙලිජ්ජවිල සහා ගොඩනැගිල්ල අපිට විධිමත් විදියට හදලා ගන්න තියනවා.ඒ වගේම පොළ භූමිය ගැටළු රාශියක් තියනවා.බිසෝදොළින් අපිට ප්‍රයෝජනයක් ගන්න පුළුවන්.තෙලිජ්ජවිල මංසන්ධියේ ගැටළු රාශියක් තියනවා.ඉදිරියේදී ඒවා වෙන් වෙන් වශයෙන් කතා කරනවා.ත්‍රීවිල් නැවතුම්පල සම්බන්ධ ගැටළු,අනවසර වෙළදාම් පිළිබඳ ගැටළු රාශියක් තියනවා.ඉදිරියේදී එකින් එක සාකච්ඡා කරමු.පක්ෂ විපක්ෂ භේදයක් නෑ ඉන්නේ ඔක්කොම අලුත් ටීම් එකක්.සාම්ප්‍රධායික දේශපාලනය ගෙනියන්න සභාපතිතුමාගේ අදහසක් නෑ.සම්ප්‍රධාය තුළින් ගන්නෙ හොඳ දේවල් විතරයි.සියලු දෙනා සාමූහිකව මැදිහත් වෙලා සභාවට තිබුණු නරක නම අයින් කරමු.සභික ධූරත්වය ගෞරවනීය තත්වයකට පත් කරන්න කටයුතු කරමු කියන යෝජනාව කරමින් මා නිහඬවනවා ස්තූතියි.

**ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා**

සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.ඉදිරි වසර 4 තුළ ප්‍රදේශයේ ජනතා අභිලාෂයන් ඉටු කරන්න හැකිවන කාලයක් වේවායි සුභ පතනවා.මම හොරගොඩ කොට්ඨාශය නියෝජනය කරමින් ජයග්‍රහණය කරලා සභාවට තේරීපත්වන්නේ ඒ වෙනුවෙන් ඡන්ද ලබා දුන් සියලුම ඡන්ද දායකයින්ට මාගේ ස්තූතිය ප්‍රකාශ කරන්න

කැමතියි.සභාපතිතුමා ආරම්භයේදිම ප්‍රකාශ කලා මොන දේශපාලන පක්ෂයක වුනත් ජනතා සුභ සිද්ධිය උදෙසා එකම කණ්ඩායමක් ලෙස කටයුතු කරමු කියලා.ඒ ආරාධනාව ස්තුති පූර්වකව භාරගෙන ජනතා බලාපොරොත්තු ඉටු කරන්න අවශ්‍ය ඕනෑම මොහොතක සහයෝගය ලබා දෙනවා.ජනාධිපතිතුමාගේ සිට බොහෝ රාජ්‍ය ආයතන වල වියදම් අඩු කරමින් ජනතාවට යම් ආදර්ශයක් දීල තියනවා.ඒ හේතුව නිසා තමයි සභාවේ රියදුරු මහතුන් සිටියදී සභාපතිතුමාගේ නිල රථයට ආදේශක රියදුරෙක් බඳවා ගන්නවට විරුද්ධව ජන්දය ප්‍රකාශ කලේ.ඔබතුමා සමඟ සහෝදර මන්ත්‍රීවරයෙක් ලෙස කලින් සභාවේ වැඩ කරද්දි දකින්න ඇති සමහර කටයුතු වලදි අඩුපාඩුවක් දැක්කම ඒ වෙලාවෙම අපි විරෝධය ප්‍රකාශ කලා.ඒ වගේම හොඳ කාරණා සඳහා සහයෝගය ලබා දුන්නා.මං වෙන පක්ෂයකින් මන්ත්‍රී ධූරයක් ලැබුවත් හොරගොඩ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා කිසිදු අගතියකින් තොරව සහයෝගය ලැබෙයි කියලා බලාපොරොත්තු වනවා.සහෝදර මන්ත්‍රීතුමා අදහස් දක්වමින් කියා සිටියා සභාව පිළිබඳ නරක මතයක් සමාජ ගතවෙලා තියනවා කියලා.මං ඒ අදහස බැහැර කරන්න කැමතියි.සභාපතිතුමාට හෝ මන්ත්‍රීවරුන්ට එවැනි කටයුතු කරන්න බෑ අධීක්ෂණ කටයුතු හා මුදල් ගෙවීම් සියල්ල සිදුවන්නේ රාජ්‍ය නිලධාරීන් හරහා.දේශපාලඥයන්ට චෝදනා එල්ල වන ප්‍රමාණය කොපමණද ඒ හා සමාන ප්‍රමාණයක් රාජ්‍ය නිලධාරීන්ටත් චෝදනාව එල්ලවනවා.මන්ත්‍රීවරු නොමැති කාලය තුළ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය ජනතා ඉල්ලීමට සවන් දීලා දැවැන්ත කාර්යභාරයක් කලා.ඒ වෙනුවෙන් එතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූතිය ප්‍රකාශ කරන්න කැමතියි.සියලු දෙනාගේ අභිලාෂය මාලිම්බඩ සංවර්ධනය නම් එකාවන්ව වැඩ කරලා ඒ සංවර්ධනයට දායක වෙමු කියන ආරාධනාවෙන් නිහඬවනවා ස්තූතියි.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජීත් මහතා</u>**
මන්ත්‍රීතුමාගේ අදහසට යම් දෙයක් එකතු කලයුතු යැයි මා විශ්වාස කරනවා.නිලධාරීන් නැතුව සභාපතිවරුන්ට මන්ත්‍රීවරුන්ට වංචා දූෂණ හොරකම් කරන්න බෑ කියන දේ තමයි මන්ත්‍රීතුමාගේ කතාවෙන් කෙටියෙන් අදහස් වුනේ.මං ඒකට එකඟවනවා.එහෙම කරන්න බෑ තමයි.නිලධාරීන්ට පමණක් චෝදනාව එල්ලවන නිසා මං මේ පැහැදිලි කරන්නේ.යම් අවස්ථාවල නිලධාරීන් අපහසුතාවයට පත්වන්නේ දේශපාලන අධිකාරියේ බලපෑම නිසා.අපේ කළින් තිබුණු පාලනේදී නිලධාරීන් එවැනි අවස්ථාවලට ඉඩ දුන්නේ නෑ.උදාහරණ වශයෙන් යෝජනාවක් ආවා සභාවේ මුදල් වලින් ප්‍රදේශයේ පොත් බෙදා දීමක් සිදු කරන්න.ඊට විපක්ෂව ජන්දය දුන්නේ මං විතරයි.ඒ යෝජනාව සියලු දෙනාගේ ජන්දයෙන් සම්මත වුණා.නිලධාරීන් මැදිහත් වෙලා නීත්‍යානුකූල නොවන නිසා එය ප්‍රතික්ෂේප කලා.අපේ පාලන කාලය තුළ කිසිදු වැරදි දෙයකට මේ නිලධාරීන්ට ආරාධනාවක් කරන්නෑ කියන විශ්වාසය මේ වෙලාවේ සහතික කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා</u>**
සියලු දෙනාගෙන් අවසරයි.සභාපතිතුමනි,මුලින්ම ජාතික ජන බලවේගයේ ඉහළ ක්‍රියාකාරීත්වයට මාගේ ප්‍රණාමය පුද කරන්න කැමතියි.මා නියෝජනය කරන්නෙ කිරිමැටිමුල්ල කොට්ඨාශය.ඒ ප්‍රදේශයේ සියලුම ජනතාවට මා වෙනුවෙන් ජන්දය ලබාදීම පිළිබඳ මාගේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා.සභාපතිතුමනි,මම කිරිමැටිමුල්ල උතුර සහ දකුණ කොටස් දෙක තමා නියෝජනය කරන්නෙ.ප්‍රජා ශාලාවක් තියනවා ඒ කාලේ පවුල් 60ක් පමණ ජීවත් වන කාලයේ හදපු එකක් දැන් ඒ ප්‍රදේශයේ පවුල් 840ක් පමණ ජීවත්වනවා.ඒ නිසා ප්‍රජා ශාලාව ප්‍රමාණවත් නෑ.ඒ වගේම තමයි විදුලිය පවා විසන්දි කරලා තිබුණා ලේකම්තුමියගේ මැදිහත් වීමෙන් නැවත විදුලිය ලබා ගත්තා.ඉතාම අබලන් තත්වයේ තියෙන්නේ.ඒ ආසන්නයේම ක්‍රීඩා පිටියක් තියනවා ඒකත් වැඩි දියුණු කරොත් ඉතාම වටිනවා.

සභාපතිතුමනි,ඒ වගේම කිරිමැටිමුල්ල දකුණ ප්‍රදේශයේ ක්‍රීඩා පිටියකට වෙන් කරන ලද විශාල ඉඩමක් තියනවා.අදවන විට වල් බිහිවෙලා විවිධ අකටයුතුකම් වලට යොදා

ගන්නවා.ප්‍රදේශයේ ජනතාවට ප්‍රයෝජනයට ගත හැකි ස්ථානයක් නිසා ඒ පිළිබඳ සොයා බලා ප්‍රයෝජනවත් ලෙස භාවිතයට ගැනීම වැදගත් බවත් ගරු සභාවට ප්‍රකාශ කරනවා.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

මන්ත්‍රීතුමා වෙනත් කරුණු යටතේ යෝජනා ඉදිරිපත් කරන්න ගියොත් මන්ත්‍රීවරු 18 දෙනාම විශාල කාලයක් ගතවනවා.ඒ නිසා යෝජනා කළින් ඉදිරිපත් කරන්න.වෙනත් කාරණා කියලා න්‍යාය පත්‍රයේ සඳහන් කරන්නෙ යම් කෙටි කාරණාවක් ඉදිරිපත් කරන්න.යෝජනා විදියට ඉදිරිපත් කරන්න ගියොත් සභාව පවත්වාගෙන යන්න අපහසු වනවා.සභාව පවත්වා ගෙන යන්න යම් අපහසුතාවයක් සිදු වුනොත් සභාපතිවරයා විදියට ඒ මන්ත්‍රීවරයාගේ කතාව නවත්තන්න වෙනවා.විවේචන හෝ යෝජනා විදියට ඉදිරිපත් නොකර ප්‍රදේශයේ මන්ත්‍රීවරයා ලෙස ඔබතුමාගේ වගකීම සංවර්ධන කටයුතු සඳහා සභාව මැදිහත් කරගන්න එක.සභාව පවත්වා ගෙන යාම අපහසු වන ඕනෑම අවස්ථාවක සභාපතිවරයා ලෙස බලය පාවිච්චි කරනව බව ප්‍රකාශ කරන්න මෙය අවස්ථාවක් කරගන්නවා.

**<u>ගරු මන්ත්‍රී ජේ.එල්.සුමිත් මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි.මම එක්සත් ජාතික පක්ෂයෙන් ඇල්ගිරිය කොට්ඨාශය නියෝජනය කරමින් සභාවට තේරී පත්වන්නේ.මෙහි මූලිකත්වය දැරූ කණ්ඩායම් නායකත්වත්වයට හා ඇල්ගිරිය ප්‍රදේශවාසීන්ට මේ අවස්ථාවේ ස්තූතිවන්ත වෙනවා.ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වලට පක්ෂ භේදයකින් තොරව සියලු දෙනාගේ සහය ලබා දෙයි කියලා මා විශ්වාස කරන අතරම මේ සභාවට මන්ත්‍රීවරයෙක් ලෙස තේරී පත්වීම පිළිබඳ මා ඉතා සතුටට පත්වනවා.ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා</u>**

සභාවෙන් අවසරයි.ගරු සභාපතිතුමනි,ලැයිස්තු මන්ත්‍රීවරයෙක් ලෙස දම්පැල්ල කොට්ඨාශයෙන් සභාවට මන්ත්‍රීවරයෙක් ලෙස තේරී පත්වන්නේ.පක්ෂයේ ඉහල නායකත්වයට ස්තූතිය ප්‍රකාශ කරන්න මෙය අවස්ථාවක් කරගන්නවා.මා හට සහය ලබා දුන් දම්පැල්ල ජනතාව මේ අවස්ථාවේ සිහිපත් කරනවා.ප්‍රදේශයේ පොදු වැඩ කටයුතු වලදී වගේම සංවර්ධන කටයුතු වලදී මාගේ පූර්ණ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් නිහඬවනවා ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා</u>**

සියලුම දෙනාගෙන් අවසරයි.ගරු සභාපතිතුමනි,ගල්පමුණ කොට්ඨාශයේ වසම් 3ක් නියෝජනය කරනවා.පළමුව ජාතික ජන බලවේගයෙන් මාව තෝරා පත් කර එවූ සියලුම ජනතාවට මාගේ ස්තූතිය පුද කරනවා.මාලිම්බඩ ප්‍රදේශයේ අප බලාපොරොත්තු වන සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන්න ඔබතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ටත් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ශක්තිය ධෛර්ය ලැබේවායි පතමින් නිහඬවනවා ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී හෂිත සුබෝදන මාරතුඩුවගේ මහතා</u>**

ගරු සභාපතිතුමනි,මන්ත්‍රීවරුනි,මම ස්වාධීන කණ්ඩායමක් නියෝජනය කරමින් තමයි ප්‍රාදේශීය සභාවට තේරී පත් වුණේ.ඇත්තටම ඔබතුමා වගේ කෙනෙක් එක්ක වැඩ කරන්න ලැබීමත් සතුටුයි.ඔබතුමාගේ කතාවෙන්ම තේරුණා වැඩක් කරන්නම තමයි ඇවිත් තියෙන්නෙ කියලා.මම නම් කිසිදු පක්ෂයකට සම්බන්ධ නැති නිසා සියලු යහපත් කටයුතු වෙනුවෙන් මගේ සහයෝගය ලබා දෙනවා.චරිත් මහතා ප්‍රකාශ කලා වගේ මේ කාලය ඇතුළත මාලිම්බඩ නගා සිටුවීමට එක්ව කටයුතු කරමු.බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී පී.ජී.බසින්දාා පුෂ්පමාලි මෙය**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.සමගි ජන බලවේගය නියෝජනය කරමින් මාලිම්බඩ කොට්ඨාශයෙන් මන්ත්‍රීවරියක් ලෙස තේරී පත් වුණා.ඒ වෙනුවෙන් සහය දුන් වානක මල්ලව මහතාටත් මාලිම්බඩ ප්‍රදේශයේ ජනතාවටත් ස්තූතිවන්ත වන අතරම මාලිම්බඩ ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන්න උපරිම අයුරින් සහය ලබා දෙන බවත් ප්‍රකාශ කරමින් නිහඩවනවා ස්තූතියි.

**ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා**

සියලු දෙනාගෙන්ම අවසරයි.ගරු සභාපතිතුමනි,අද දවස විශේෂ දවසක් විශේෂයෙන්ම මට.මොකද කවදාවත් අපි දේශපාලනය කරන්න හිතන් හිටපු මිනිස්සු නෙවෙයි.මා කෙරෙහි තැබූ විශ්වාසයට මුලින්ම ජාතික ජන බලවේගයේ නායකත්ව සහෝදරත්වයට ස්තූතිවන්තවනවා.ඒ විශ්වාසය මත අකුරුගොඩ කොට්ඨාශයේ වසම් 3ක නියෝජිතයා ලෙස මං තේරී පත්වන්නේ.ඒ ප්‍රදේශයේ ජනතාවට මාගේ ස්තූතිය පුද කරන අතර ඒ විශ්වාසය වගකීමක් ලෙස ගනිමින් පක්ෂ භේදයකින් තොරව මාලිම්බඩ ජනතාවගේ අපේක්ෂා ඉටු කිරීම නම් අපේ අරමුණ අපිට එකට වැඩ කරන්න පුළුවන්.වැඩ කරද්දි නොයෙක් අඩුපාඩු වෙන්න පුළුවන්.සභාපතිතුමාගේ අත්දැකීම් හා ලේකම්තුමියගේ හා කාර්ය මණ්ඩලයේ සහයෝගය තුළ අපි නිවැරදි කරයි.අද තියන තත්වයට වඩා හොදින් මාලිම්බඩ තව අවුරුදු 4කින් දකින්න ලැබනවා නම් ඒක තමයි අපි ලද ජයග්‍රහණය.ඒ ශක්තිය සියලු දෙනාට ලැබේවායි ප්‍රාර්ථනා කරමින් නිහඩවනවා ස්තූතියි.

**ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා**

සියලු දෙනාට දැනුවත් කිරීමක් කරන්න තියනවා.ප්‍රදේශයේ පොල් හිඟයක් තියනවා.ඒ වෙනුවෙන් ගෙදර පොල් ගසක් නිවැරදිව නඩත්තු කරන්නෙ කොහොමද කියලා නිවැරදි අවබෝධයක් ලබා දෙන්න ලේකම්තුමිය හා නිලධාරීන් මැදිහත් වෙලා පුහුණු වැඩසටහනක් සංවිධානය කරලා තියනවා 18 වනදා පෙ.ව 10ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ පොල් වගාව සම්බන්ධ උනන්දුවක් දක්වන සියලු දෙනා එම වැඩසටහනට සහභාගී කරවන්න.ඉදිරිපත් වූ කරුණු සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.උදය සාන්ත මන්ත්‍රීතුමා අදහස් දැක්වූවා රියදුරෙක් බඳවා ගැනීම සම්බන්ධව.එතුමාගේ අදහස වූයේ වියදම් අවම කරගැනීම.රියදුරෙක් ගන්නවද නැද්ද යන්න අපි පසුවට තීරණය කරනවා.හැම සභාපතිවරයෙක්ම රියදුරෙක් ගත්තා ඒ වෙන කාරණයක් නිසා නෙවෙයි.ආරක්ෂාව හා විශ්වාසය දේශපාලනයේදී හිතන්න ඕන කාරණාවක් නිසා.මේ ආයතනයේ රියදුරන් අපිට විශ්වාසයි ඕනෑම වෙලාවක සභාපතිවරයාගේ රියදුරෙක් විදියට සම්බන්ධ කරගන්න පුළුවන් විශ්වාසයත් මට තියනවා.කිසියම් වෙලාවක අවශ්‍ය වුණොත් කියන කාරණාව මත තමයි ඒ යෝජනාව ඉදිරිපත් කලේ.වියදම් අඩු කිරීම සම්බන්ධව ගත්තොත් සභාපති උපසභාපති යන දෙදෙනාට නිවසේ ස්ථාවර දුරකථන සදහා දීමනාවක් ගෙවනවා අපි ඒක ප්‍රතික්ෂේප කලා.සභාපතිවරයෙක්ට තිබෙන බොහොමයක් වරප්‍රසාද අඩු කරලා තියනවා.මාසික දීමනාව 25000.00ක් ලැබෙනවා.කමිටු දීමනා සභාවට ඉදිරිපත් කරලා නෑ.ඒවා ගන්නවද නැද්ද කියලා ඉදිරියේදී තීරණය කරනවා.මන්ත්‍රීවරු සහයෝගයෙන් වැඩ කරන්න එකඟ වුණා.මං නැවතත් ඉල්ලා සිටිනවා වැඩ යෝජනාවක් ආවම මන්ත්‍රීවරුන්ට තියෙන්නෙ අවස්ථා තුනයි.පක්ෂව හෝ විපක්ෂව ඡන්දය ලබා දීම හෝ ඡන්දය ලබා දීමෙන් වැලකී සිටීම.ඒක ඔබේ දේශපාලන දැක්ම,කියවීම හා අවබෝධය මත තීරණ ගන්නවා ඇති.හැම තීන්දුවකම ඔබේ ගෞරවය අභිමානයට හානියක් නොවන පරිදි ඒ තීන්දුව ගන්න.ඒ හැම තීන්දුවක්ම තමන්ට ඡන්දය දීපු ජනතාවට බලපාන බව මතක් කරනවා.

සභාපතිතුමාගේ ස්තූති කථාවෙන් පසු පෙ.ව 11.10ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව